**බදු අභියාචනා කොමිෂන් සභාව - 2011**

**---------------------------------------------**

බදු අභියාචනා කොමිෂන් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ ආදායම් සහ වියදම් ගිණුම හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 බදු අභියාචනා කොමිෂන් සභාව පිහිටුවීම**

**---------------------------------------------**

2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභා පනතේ 2 ඡේදය අනුව යම් බදු ගාස්තු හෝ අයකිරීම පැනවීම හා අදාල කාරණා සම්බන්ධයෙන් වන සියළු අභියාචනා විභාග කිරීමේ වගකීම පවරා 2011 අප්‍රේල් 23 දින බදු අභියාචනා කොමිෂන් සභාව පිහිටුවන ලදි.

## 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට බදු අභියාචනා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව 2011 මැයි මාසයේ සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙල කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාම පුවරුවක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.106,243 ක වියදම ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ආ) කුලී පදනම මත ලබාගත් ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවන ලද රු.3,105,000 ක ආරක්ෂිත ඇප තැන්පතුව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ඈ) 2011 වර්ෂයේදී බදු අභියාචනා සඳහා ලැබී තිබුණු එකතුව රු.1,329,648,907 ක මුදල් / ඇපකර සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීම් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරය විසින් පරිපූරක ප්‍රතිපාදන මඟින් ලබා දී තිබුණි. ඒ අනුව අදාල කාලපරිච්ඡේදය සඳහා රු.39,892,249 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර එයින් රු.21,934,401 ක් වැය කිරීමෙන් පසු රු. 17,957,848 ක අතිරික්තයක් ඇතිවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---------------------------

2011 වර්ෂයේදී තීරකකරණය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් කොමිෂන් සභාවට බදු අභියාචනා 76 ක් ලැබී තිබුණු අතර එම අභියාචනාවල තක්සේරු වටිනාකම රු.5,703,137,132 ක් විය. තවද 2011 අප්‍රේල් 23 දින සිට ක්‍රියාත්මක වූ බදු අභියාචනා කොමිෂම වෙත ඍජුව අභියාචනා 36 ක් 2011 දෙසැම්බර් 31 වන විට ලැබී තිබුණි. එයින් වටිනාකම රු.4,663,158,312 ක්වූ අභියාචනා 28 ක කටයුතු විමර්ශනය කිරීමට භාරගෙන තිබූ අතර අභියාචනා 8ක් ප්‍රතික්ෂේප කර තිබුණි. නමුත් 2012 පෙබරවාරි 15 දින තෙක් කිසිදු අභියාචනයක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භ කර නොතිබුණු බැවින් බදු අභියාචනා කොමිෂම පිහිටුවීමේ අරමුණ 2011 වර්ෂයේදී ඉටු වී නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

--------------------------------

වර්ග අඩි 13,500 ක ප්‍රමාණයකින් යුත් ගොඩනැගිල්ලක් 2011 මැයි 20 දින සිට කුලියට ගැනීමට පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට කොමිෂන් සභාව එළඹී තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.22,064,450 ක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය පරිදි වටිනාකම රු.50,000,000 ක් ඉක්මවන ප්‍රසම්පාදන කටයුතු වලදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණ ගැනීම සිදුකල යුතු වුවත් ඊට පටහැනි ලෙස ආයතනය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැරව ආයතනයක් තෝරාගෙන තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාවක් ලබාගැනීමෙන් තොරව රු.55,890,000 ක වටිනාකමකට වසර 3 ක් සඳහා ගිවිසුම් ගතවී තිබුණි.

(ii) මෙම ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි වන්දි කොමිෂන් සභාවට අයත් කාර්යාලයක් පැවති අතර සමස්ථ ගොඩනැගිල්ල සඳහාම එකම ජල හා විදුලි මනුවක් පැවතීම හේතුවෙන් වන්දි කොමිෂන් සභාවේ ජල හා විදුලි පරිභෝජන වියදම ද බදු අභියාචනා කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණි.

(iii) ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය හා කොමිෂමේ සේවය නියුතු කාර්ය මණ්ඩලය 18 දෙනා සමග සැසඳීමේදී වාර්ෂිකව එක් අයෙක් සඳහා කුලිය රු.1,035,000 ක් වී තිබුණි. ඒ අනුව කාර්ය මණ්ඩලය හා සැසඳීමේදී ගොඩනැගිලි ඉඩකඩ භාවිතයේදී ඌන උපයෝජනයක් සිදු වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 2 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2011 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2015 ජුලි 17 වන දිනදීය.

(ආ) 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 වගන්තිය ප්‍රකාර ගිණුම් ඉදිරිපත් කිරීමේ වගකීම පිළිබඳ සහතිකය මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව නොතිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක්, ක්‍රියාකාරී සැලැස්මක් සහ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

කොමිෂන් සභාව විසින් සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාලව අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ ලේකම්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ නොපැවැත්වීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | තැන්පතු පිළිබඳ ප්‍රමාණවත් වාර්තා පවත්වා නොගැනීම. අභියාචනා අවසන් වනතෙක් තැන්පතු කාලය දීර්ඝ නොකිරීම. |